සැ.යු .- 2015.10.30 දින පළ වූ අංක 1939 දරන ගැසට් පත්‍රයේ VI (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,940 - 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා - 2015.11.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 674 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 674 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 675 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 679 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ.යු .- ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත සහ 2016 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 නොවැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


673 – B 080999 —402 (2015/11)
A 1-

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 379

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ප්‍රකාරව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ආර්. එම්. එස්. සරත් කුමාර මහතා 2013 ජනවාරි මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 8/1

2015 අංක 380

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ප්‍රකාරව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ මොහොට්ටාල්ලාගේ නිහාල් රණසිංහ මහතා 2014 ඔක්තෝබර් මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු ආගමන හා විගමන පාලක ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 8/2

2015 අංක 381

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා මුද්‍රණ සේවයේ I පන්තියේ ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා මහතා 2015 ජනවාරි මස 21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු වැඩබලන රජයේ මුද්‍රණාලයාධිපති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 8/3

2015 අංක 382

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එච්. ජී. සුමනසිංහ මහතා 2015 ජූලි මස 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 8/4

# වෙනත් පත්කිරීම් ආදිය

2015 අංක 383

**අධිකරණ අමාත්‍යාංශය**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 (3) වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම පහත උපලේඛනයේ සඳහන් නීතිඥ මහත්ම මහත්මීන් අදාළ අධිකරණ කොට්ඨාස සඳහා සමාදාන විනිශ්චයකාරවරුන් සහ නිලනොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත්කරමි.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

| අනු. අංකය | නම | ලිපිනය | අධිකරණ කොට්ඨාසය |
|---|---|---|---|
| 1. | නීතිඥ සිදම්පරපිල්ලෙයි පත්මනාබන් මහතා | අංක 9/3, තාමරෙයිකේනි පාර, මඩකලපුව, | මඩකලපුව |
| 2. | නීතිඥ ගලතර ලේකම්ගේ පියල් ගයාන් පෙරේරා මහතා | අංක 32/1, සාන්ත චාර්ල්ස් පටුමග, . විල්ලෝරවත්ත, මොරටුව | මොරටුව |
| 3. | නීතිඥ ක්‍රිෂාන්ති වත්සලා විජේසේකර මහත්මිය | නාගොඩ, ගාල්ල | බද්දේගම |
| 4. | නීතිඥ කුරුවිට මුදියන්සේලාගේ කුමුදිනී හේමමාලි මන්ත්‍රීරත්න මහත්මිය | අංක 108, අන්ගම්මන පාර, රත්නපුර | රත්නපුර |
| 5. | නීතිඥ පද්මිණී මර්ලින් ජානකී නවරත්න මහත්මිය | ''ජෙස්මින් විලා'', අඹගහලන්ද වත්ත, යක්කල. | ගම්පහ |
| 6. | නීතිඥ දෝන නිමාලි ඇස්ට්‍රිඩා රන්දෙනිය මහත්මිය | අංක 416ඒ, දොලහේන පාර, බටගම දකුණ, කඳාන. | මීගමුව |
| 7. | නීතිඥ සනත් වසන්ත රාමනායක මහතා | අංක 313, උඩුපිල, දෙල්ගොඩ. | මහර |
| 8. | නීතිඥ රාජකරුණා පුංචි බණ්ඩා ඉලංගසිංහ මහතා | අංක 196, උසාවි පෙදෙස, අනුරාධපුරය | අනුරාධපුර |
| 9. | නීතිඥ උමන්ගේ සුනිල් චන්ද්‍රසිරි මහතා | අංක 22/ඒ, සමන් උයන, දඹහේන පාර, මහරගම | ගල්කිස්ස |

11 - 67

---

# රජයේ නිවේදන

## උකස් පනත

89 වැනි අධිකාරය වූ උකස් පනතේ 3 (ඇ) හා 114 (2) වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ ජනරාල් සොනාලි විජේරත්න වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම පනතේ කාර්යයන් සඳහා 2015 ඔක්තෝබර් 9 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

සොනාලි විජේරත්න,
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්.

2015 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
2. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්.

11-7/1

---

## භාර ලදුපත් ආඥා පනත

1990 අංක 13 දරන පනතින් සංශෝධිත 1947 අංක 12 දරන භාර ලදුපත් ආඥා පනතේ 6 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ ජනරාල් සොනාලි විජේරත්න වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම ආඥාපනතේ කාර්යයන් සඳහා 2015 ඔක්තෝබර් 9 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

සොනාලි විජේරත්න,
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්.

2015 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
2. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්.

11-7/2

---

## දේශීය භාර ලදුපත් පනත

1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනතේ 6 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාණිජ අධ්‍යක්ෂ ජනරාල් සොනාලි විජේරත්න වන මම මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ආයතන එම පනතේ කාර්යයන් සඳහා 2015 ඔක්තෝබර් 9 වැනි දින සිට වලංගු වන පරිදි අනුමත කළ ණය දෙන ආයතන බවට මෙම නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

සොනාලි විජේරත්න,
වාණිජ අධ්‍යක්ෂ ජනරාල්.

2015 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී.
2. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්.

11-7/3

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/14/2015/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.11.06 වැනි දින සිට 2015.11.20 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.11.127 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 1278 වෙළුමේ 295 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙ පත්තුවේ, සල්පිටි කෝරළයේ බොරලැස්ගමුව පිහිටි 'අබේකෝනමගේවත්ත හෙවත් ඇටහෙරලියගහවත්ත හෙවත් අලුබෝගහකුරුදුවත්ත' නැමති ඉඩමෙන් බෙදා වෙන්කළ අංක 03 දරන කැබැල්ලට එච්. එන්. ජයවර්ධන බලයලත් මානක විසින් 1991.11.02 දින මැන සාදන ලද අංක 416 දරන පිඹුර ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : ලොට් 02<br>*නැගෙනහිර* : එස්. අර්නෝලිස්ගේ ඉඩම<br>*දකුණ* : ලොට් 06<br>*බටහිර* : ලොට් 07 (අඩි 15 පාර)<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 11. | 01. ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1993.07.01 දින ලියා සහතික කරන ලද අංක 2347 දරන විකුණුම්කරය.<br><br>02. පී. බුද්ධදාස ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.01.22 දින ලියා සහතික කරන ලද අංක 2443 දරන උකස්කරය.<br><br>03. පී. බුද්ධදාස ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.01.22 දින ලියා සහතික කරන ලද අංක 2442 දරන විකුණුම්කරය. |

**1941 අංක 39 දරන ණයසහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතර බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥා පනතේ 25 (1), 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. කේ. රත්නසූරිය මිය,
ලේකම් (වැ.බ),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2015 ඔක්තෝබර්
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 43591 | කනංකේ පතිරණගේ අජිත් මයා, අංක 226/A ජිනරතන මාවත, කරදියාන, මඩපාත. | වැලිසරගේ සිරියාවතී ප්‍රනාන්දු මිය. අංක 136/2, දැල්තර, පිළියන්දල, |
| (02) 43629 | මැලැගොඩ ගමගේ බන්දුසේන මයා, අංක 236/12, කළුවැල්දෙනිය, ඕවිටිගම, මීගොඩ. | හොරණ මහමුනිගේ අතුල ශ්‍රී රන්පිඩ මයා, අංක 33/1, සිරිවර්ධන පාර, දෙහිවල. |
| (03) 43595 | රණසිංහ ආරච්චිගේ ශ්‍රියා නන්දනී මිය, අංක 133/11, ගොඩපරගහහේන, කිරිවත්තුඩුව. | කපුගම ගීගනගේ ගයාන්ත සඳමාල් මයා, අංක 187/1/1, මුණමලේ වත්ත, කිරිවත්තුඩුව. |
| (04) 43577 | සම්පතා වඩුගේ නිශාන් සිල්වා මයා, අංක 288, සමගි මාවත, කළුදැවල, පානදුර. | වඩුගේ ශාන්ති ප්‍රනාන්දු මිය, අංක 67, සංඝානන්ද මාවත, නල්ලූරුව, පානදුර. |
| (05) 43592 | ජසෙන්තු හේවාගේ සීලටි ප්‍රනාන්දු මිය, අංක 62, වසන්තාරාම පාර, මොල්ලිගොඩ, වාද්දූව. | ඔගෙල්කෝ ඉංජිනියරින් පෞද්ගලික සමාගම, අංක 500ඒ, ගාලුපාර, වාද්දූව. |
| (06) 43055 | වාහල තන්ත්‍රිගේ දෝන ශීලා ප්‍රියානි ගුණසේකර මිය, අංක 298, බටුවත්ත, රාගම. | උඩවත්ත අප්පුහාමිලාගේ දොන් ප්‍රියන්ත සමරසේකර මයා, අංක 689/බී, නාරංගොඩ පාළුව, බටුවත්ත. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (07)<br>40535 | 01. හේවා පේඩිගේ තිලක් කරුණාරත්න මයා<br>අංක 413-ඒ,<br>කුඹල්ඹළුව,<br>වේයන්ගොඩ.<br><br>02. වීරසිංහ ආරච්චිගේ සුමනාවතී මිය,<br>අංක 488/3,<br>බණ්ඩාරනායක පාර,<br>වේයන්ගොඩ. | පතිරණ ගමගේ සුසිලාවතී මිය,<br>අංක 113/1,<br>මොට්ටුන්න,<br>වේයන්ගොඩ. |
| (08)<br>43560 | සෙල්ලප්පුලිගේ ජෝශප් එම්මානුවෙල් රෝසා මයා,<br>අංක 485/3/3 ඒ,<br>ශාන්ත සෙබස්තියන් මාවත,<br>කටුනායක. | 1. මදනසිංහගේ මේරියන්,<br>නිරංජලා කුමුදිනී මිය,<br>අංක 682/80,<br>කොළඹ පාර,<br>දෙවන කුරණ,<br>මීගමුව.<br><br>2. විලියම් ජෝන් ප්‍රේමජයන්ත් මයා,<br>අංක 215/ජේ/1,<br>පොල්හේනවත්ත,<br>නැදගමුව,<br>කොටුගොඩ. |
| (09)<br>43411 | වීරහැන්නදිගේ ඊබට් ටයිටස් ප්‍රනාන්දු මයා,<br>අංක 99,<br>රිව්දෙව් ගම,<br>පරත්ත,<br>කෙසෙල්වත්ත,<br>පානදුර. | පුංගිගේ ටියුෂන් පීරිස් මයා,<br>අංක 29/2,<br>ගැමුණු මාවත,<br>කෙසෙල්වත්ත,<br>පානදුර. |
| (10)<br>42910 | කොඩිකාරගෙදර සෙනෙවිරත්න කොඩිකාර මයා,<br>අංක 36,<br>මහරතැන්න,<br>මැණික්හින්න. | කෝදාගොඩ ආරච්චිගේ ප්‍රභානි රසාංජලී පෙරේරා මිය,<br>අංක 30/ඒ,<br>උඩගම,<br>මැණික්හින්න. |
| (11)<br>43445 | වන්නි ආරච්චිගේ ලලිත් ප්‍රියන්ත,<br>නානායක්කාර මයා (මියගොස්),<br>උරුමක්කරුවන් :<br>1-1 හබරගමුවගේ ප්‍රියන්තිකා පීරිස් මිය,<br>අංක 42,<br>යටියන,<br>බණ්ඩාරගම.<br><br>1-2 වන්නිආරච්චිගේ ආධිත්‍ය පින්සර නානායක්කාර මයා,<br>අංක 42,<br>යටියන,<br>බණ්ඩාරගම. | හේවා විතාරණගේ අසංග සංගීත් සිල්වා මයා.<br>බතලවත්ත,<br>පහළ පාර,<br>කවටයාගොඩ,<br>මහාගෝනදූව,<br>මොරොන්තුඩුව. |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අමානා බැන්ක් පීඑල්සී - ගාල්ල ශාඛාව (PB 3618 PQ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

ගණුදෙනු /ගිවිසුම් අංකය : 001-0172990-001.

අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.09.19 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

"(2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද බැංකු සමාගමක් වන ලියාපදිංචි අංක PB 3618 PQ දරන කලින් අමානා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ) අමානා බැන්ක් පීඑල්සී වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් රාජේන්ද්‍රා නාරංගොඩ විසින් සහතික කරන ලද 2013.10.14 වැනි දින අංක 908 දරන මූලික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "බන්ධනදායී" යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකාවේ ගාල්ලේ පිහිටා ඇති "නිලාම් ස්ටෝර්ස්" යන නාමය සහ අභිධානය යටතේ ඉවත දමන ලද ලෝහ වෙළෙඳාම් කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින M. H. M. නිලාම් විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කරය මත 2015 අප්‍රේල් මස 16 වැනි දින වන විට දැනට රුපියල් මිලියන විසිදෙකයි පනස් පන් දහස් හයසිය විසිනමයක් වූ (රු. 2,20,55,629) මුදලක් අමානා බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර ඇතිනම් එම ගෙවීම අඩුකිරීමෙන් පසුව 2015 අප්‍රේල් මස 17 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා සියයට දාසයක (16%) ලාභ/අතිරික්ත මිල/කුළී මුදල් සහ දරන ලද වෙළෙඳ ප්‍රචාරක පිරිවැය, මෙන්ම වෙනත් ගාස්තු සමගින් රු. 2,20,55,620ක් වූ ඉහත කී මුදල අයකර ගැනීම සඳහා ඉහත කී අංක 908 දරන උකස් බැඳුම්කරය මගින් අමානා බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ අමානා බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම කෝරළයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 388A පොල්වතු මෝදර ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, දෙනිපිටියේ පිහිටා ඇත්තා වූ ද, වැලිහාරනදෙනියේ වත්ත ලොට් අංක 1, වැලිහාරනදෙනියේ වත්ත ලොට් B, C, D, E සහ F දරන ඒකාබද්ධ කොටස්වලින් යුක්ත වූ ලොට් අංක 1 වැලිහාරදෙනිය හෙවත් අලුත්දෙනිය හෙවත් දවටගහදෙනිය ලොට් අංක 1, 2, 3 බැද්දගේ වත්ත ලොට් A, බැද්දගේවිට ලොට් B, බැද්දගේ කුඹුර ලොට් C සහ C1, පිහිටා ඇති ආකාරයට පොල්වතු මෝදර, දෙනිපිටිය ප්‍රධාන මාර්ගයේ ලොට් A ලෙස ලකුණු කර ඇති ත්‍රිකෝණාකාර ඉඩම යන ඉඩම්වලින් ඒකාබද්ධ වූ ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් සාදන ලද 1982 ජුනි මස 02 වැනි දින අංක 2068 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති ඊසානදිගට : එම ඉඩමේම ලොට් අංක 14 හා වැලිහාරනදෙනියේ වත්ත දරන කොටස ද, ගිණිකොණදිගට : වැලිහාරනදෙනියේ වත්ත සහ බඩල්ගෙවත්ත ලොට් අංක 2 සහ 3 දරන කොටස් ද නිරිත දිගට :බඩල්ගෙවත්ත සහ පොල්වතු මෝදර සිට දෙනිපිටිය දෙසට වූ ප්‍රධාන මාර්ගය ද, වයඹදෙසට : ඇල ද යන මායිම් තුළ පිහිටි මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ D 896/259 දරන පත්ඉරුවේ/වෙළුමේ ලියාපදිංචි වී ඇති 2068 දරන ඉහත කී පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් අක්කර 1 රූඩ් 2 පර්චස් 8ක් (අ. 1, රූ. 2, පර්. 8) වූ ලොට් අංක 1, 15, 16, 17, 18, 19, 20, 21 සහ 22 දරන බෙදා වෙන්කළ යාබද ඉඩම් කෙටස් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එච්. මහේෂ තිරිමාන්න,
නීති ප්‍රධානී.

11 - 138

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 592547

2015 අගෝස්තු මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2010 මාර්තු මස 25 වැනි දින සහතික කරන ලද අංක 1364 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අතුකෝරලගේ ශයිරා ක්‍රිෂාන්ති පෙරේරා සහ මිහිඳුකුලසූරිය අලංකාරගේ මේරි පෙරේරා ණයකරුවන් හැටියට සහ අතුකෝරලගේ ශයිරා ක්‍රිෂාන්ති පෙරේරා උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්ලක්ෂ විසිහතරදහස් තුන්සිය හැත්තෑ නවයයි ශත හතළිස් එකක (රු. 50.24,379.41) මුදලක් 2015 ජුනි මස 22 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් පනස්ලක්ෂ විසිහතරදහස් තුන්සිය හැත්තෑ නවයයි ශත හතළිස් එක (රු. 50,24,379.51) මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජුනි මස 23 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 33,65,905.16ක මුදල මත 15.5%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 1364 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ ද 2 වන මහලේ අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි."

### උපලේඛනය

බස්නාහිර පළාතේ නමුත් මීගමුව කොට්ඨාසය තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඒකල හි පිහිටි ඒකල කුරුදුවත්ත සහ කටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් 2007 ජනවාරි මස 25 වැනි දින සාදන ලද අංක 4230 A දරන පිඹුරේ ලොට් 16 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 20න් ද, නැගෙනහිරට : ලොට් 15න් ද, දකුණට : එම ඉඩමේම ලොට් 1C න් ද සහ බස්නාහිරට : ලොට් 17න් සහ මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ වැවිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 235/134 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම පාරක් සඳහා වෙන්කරන ලද මාර්ගය මතින් මාර්ග අයිතිය ද සඳහන් පරිදි විස්තර වේ.

ඉහත සඳහන් ඒකලහි පිහිටි ඒකල කුරුඳුවත්ත සහ කටුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් 2007 ජනවාරි මස 25 වැනි දින සාදන ලද අංක 4230 A දරන පිඹුරේ ලොට් 20 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1, 2, 3, 4, 5, 6, 7, 8 සහ 9න් ද, නැගෙනහිරට : ලොට් 9 සහ 10න් ද, දකුණට : ලොට් 10, 11, 12 ,13, 14, 15, 16, 17, 18 සහ 19න් ද සහ බස්නාහිරට : අඩි 15ක් පළල පාර සහ ලොට් A 8806 න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විසිඑකයි දශම තුනයි පහක (අ. 0, රූ. 0, පර්. 21.35) විශාලත්වයෙන් යුක්ත වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 235/133 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

2015 අගෝස්තු මස 28 වැනි දින.
10 - 152

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - පංචිකාවත්ත ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ප්‍රින්ට්ලයින් කම්පියුටර් සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015ක් වූ සැප්තැම්බර් මස 23÷ වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

එනම්, ඉහත කී ප්‍රින්ට්ලයින් කම්පියුටර් සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් බන්ධනදායී වශයෙන් ද, අරවින් නවරත්නම් විසින් උකස්කරු ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද වර්ෂ 2014ක් වූ මාර්තු මස 28 වැනි දිනැති අංක 5258 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 5258 දරන උකස්කරය මත, වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 06 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එක් මිලියන දහනව ලක්ෂ අසූ දෙදහස් හයසිය හැට දෙකයි ශත හැට හතර (රු. 1,19,82,662.64)ක මුදලක් ද, වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 07 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් එක් මිලියන දහනව ලක්ෂ තිස් පන් දහස් පන්සිය හැත්තෑ හතරයි ශත තිස් හතරක් (රු. 1,19,35,574.34) දක්වා වූ මුදල මත වර්ෂයකට 24%ක පොළිය ද, ඉහතකී බන්ධනදායී සහ උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතු සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු එකී රුපියල් එක් මිලියන දහනව ලක්ෂ අසූ දෙදහස් හයසිය හැට දෙකයි ශත හැට හතරක (රු. 1,19,82,662.64) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව කෝට්ටේ, බැද්දගාන පාරේ, අංක 134හි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. සේනාපති වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ."

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (ගම්පහ ලියාපදිංචි කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ හැඳල උපකාර්යාල සීමාවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැඳල දකුණ අංක 172 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, හැඳල ග්‍රාමයේ, අල්විස් නගරයේ පිහිටි ඇල ඉවුර පටුමගේ, වරිපනම් අංක 170/66 දරන නැඳුන්ගහ කුඹුර නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2014.03.28 දිනැති අංක 4953 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 සහ 2 දරන කැබලි ඒකාබද්ධ කොට නැවත බෙදා වෙන් කරන ලද බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2004.12.20 දිනැති අංක 4953/ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 51 නමැති උතුරින් : මෙම ඉඩමේ ලොට් 52 සහ 50 ද, නැගෙනහිරින් : මෙම පිඹුරේ ලොට් 50 ද අංක 1487 දරන පිඹුරේ ලොට් 2 ද, සහ මෙම පිඹුරේ ලොට් 66 ද, දකුණින් : අංක 4953/ඒ දරන පිඹුරේ ලොට් ආර් 8 ද, බස්නාහිරින් : මෙම ඉඩමේ ලොට් ආර් 8 සහ 52 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක් හෙවත් හෙක්ටයාර් 0.02023ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරු L 73/04හි ලියාපදිංචි කර ඇත.

තව ද, පහත දැක්වෙන මාර්ග රක්ෂිතය මතින් සහ ඔස්සේ පවතින මාර්ග අයිතිය සහ අනෙකුත් අනුබද්ධ පරවශ අයිතීන්ද සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (ගම්පහ ලියාපදිංචි කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ හැඳල උපකාර්යාල සීමාවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැඳල දකුණ අංක 172 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, හැඳල ග්‍රාමයේ, අල්විස් නගරයේ පිහිටි ඇල ඉවුර පටුමගේ, වරිපනම් අංක 170/66 දරන නැඳුන්ගහ කුඹුර නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2014.03.28 දිනැති අංක 4953 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 සහ 2 දරන කැබලි ඒකාබද්ධ කොට නැවත බෙදා වෙන් කරන ලද බලයලත් මිනින්දෝරු ඩී. ප්‍රසාද් විමලසේන විසින් මැන සාදන ලද 2004.12.20 දිනැති අංක 4953/ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් ආර් 8 (මීටර් 9ක් පළල පාර රක්ෂිතය) නමැති උතුරින් : මෙම පිඹුරේ ලොට් ආර්. 7, 52, 51, 66, 67, 68, 71 සහ 72 ද, නැගෙනහිරින් : මෙම පිඹුරේ ලොට් 52, 51, 66, 67, 68, 71, 72 සහ පාර ද, දකුණින් : මෙම පිඹුරේ පාර සහ ලොට් 73, 70, 69, 65, 64 සහ 63 ද, බස්නාහිරින් : මෙම පිඹුරේ ලොට් 73, 70, 69, 65, 64, 63, 62 සහ ආර් 5 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම එක (අ. 0, රූ. 0, පර්. 33.1) ක් හෙවත් හෙක්ටයාර් 0.04022ක් විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රය L 73/05හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

11 - 167

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| නොවැම්බර් | 2015.11.06 | සිකුරාදා | 2015.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.13 | සිකුරාදා | 2015.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.20 | සිකුරාදා | 2015.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.27 | සිකුරාදා | 2015.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2015.12.04 | සිකුරාදා | 2015.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.11 | සිකුරාදා | 2015.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.18 | සිකුරාදා | 2015.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.23 | බදාදා | 2015.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2016** | | | |
| ජනවාරි | 2016.01.01 | සිකුරාදා | 2015.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.08 | සිකුරාදා | 2015.12.23 | බදාදා | දහවල් | 12.00 |
| | 2016.01.14 | බ්‍රහස්පතින්දා | 2016.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.22 | සිකුරාදා | 2016.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.29 | සිකුරාදා | 2016.01.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.